ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය Business & Accounting Studies

| 60 | S | I, II |
|---|---|---|

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) තරඟ විභාගය 2022 පෙබරවාරි
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2022 செப்டம்பர்
Genaral Certificate of Education (Ord. Level) Examination, February 2022

# ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I, II
# வணிகக் கல்வியும் கணக்கீடும் I, II
# Business and Accounting Studies I, II

## ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

**වැදගත් :** ❖ උපදෙස් දී ඇති පරිදි ප්‍රශ්ණ 5කටපමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

- ❖ පළමුවන ප්‍රශ්ණය ඇතුලුව I කොටසින් ප්‍රශ්ණ 2ක් ද, II කොටසෙන් ප්‍රශ්ණ 2ක් ද බැගින් තෝරාගෙන ප්‍රශ්ණ 5කට පමණක් පිළිතුරු සපයන්න.
- ❖ පිළිතුරු පැහැදිලි අත් අකුරින් ලියන්න.

01. ජාතික හෝටල් පාසලේ ආහාරපාන පිළියෙළ කිරීම පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් හැදෑරූ සුමින්ද සංචාරක හෝටලයක වසර 2ක් සේවය කළේ ය. තමන්ගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අදහස් කළ ඔහු කාර්මික ජනපදයක් පිහිටි තම නිවස ආසන්නයේ ම ගොඩනැගිල්ලක් මාසිකව රු. 20,000 කට කුලියට ගෙන තමා ඉතිරිකර ගෙන තිබූ රු. 500,000ක් ද, රු. 400,000ක් වටිනා තම මෝටර් රථය ද යොදවා **සුමිරි බොජුන් හල** නමින් ආහාර අළෙවි කිරීමේ ව්‍යාපාරයක් 2021 ජනවාරි 01 දින ආරම්භ කරන ලදි.

තමා සමග ම ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරූ ජයන්ත මාසිකව රු. 30,000ක වැටුපකට කළමණාකරුවෙකු ලෙස ද, තවත් සේවකයින් දෙදෙනෙකු ද එදිනම ව්‍යාපාරයට බඳවා ගත් අතර. රු. 200,000ක් බැංකු ණයක් ද ලබා ගෙන ව්‍යාපාරයට යෙදවීය. රු. 40,000ක ආහාර පිළියෙල කිරීමේ උපකරණ ද එදින මිලදී ගන්නා ලදි.

ජනවාරි මාසය තුළ පහත සඳහන් ගනුදෙනු සිදුවිය.

| | |
|---|---|
| ආහාර ද්‍රව්‍ය මිලට ගැනුම් | රු. 70,000 |
| විදුලි ගාස්තු | රු. 3,000 |
| සේවක වැටුප් | රු. 20,000 |
| කළමණාකරු වේතන | රු. 30,000 |
| ප්‍රවාහන වියදම් | රු. 2,500 |
| විකුණුම් ආදායම | රු. 200,000 |

ව්‍යාපාරය දිනෙන් දින දියුණුවට පත්වන බැවින් නීතිමය පුද්ගලභාවයක් ඇති ව්‍යාපාරයක් බවට සුමිරි බොජුන්හල පත්කිරීමට ද සුමින්ද අදහස් කරයි.

ඉහත තොරතුරු ඇසුරෙන් i සිට x දක්වා ප්‍රශ්ණවලට පිළිතුරු සපයන්න.

i. අ. මෙම ව්‍යාපාරය අයත්වන ව්‍යාපාර සංවිධාන වර්ගය කුමක් ද?
   ආ. මෙම ව්‍යාපාරයේ දැකිය හැකි ශක්තියක් හා අවස්ථාවක් ලියන්න.

ii. අ. සුමිරි බොජුන් හල සපුරාලන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක් ද?
   ආ. ව්‍යාපාරයේ කළමණාකරු ලෙස ජයන්තගේ ව්‍යාපාරය බලාපොරොත්තු වන කරුණු 2ක් ලියන්න.

iii. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කළ යුතු ද? හේතු දක්වන්න.

iv. මෙම ව්‍යාපාර සංවිධානයේ වාසි 2ක් හා අවාසි 2ක් ලියන්න.

v. අ. 2021 ජනවාරි 01 දිනට මූලික ගිණුම් සමීකරණය දක්වන්න.
   ආ. එදිනට ව්‍යාපාරයේ මුදල් ශේෂය කොපමණද ?

vi. සුමිරි බොජුන් හල ව්‍යාපාරය භාවිත කරන මූලික පොත් නම් කර ඊට අදාල මුලාශ්‍ර ලේඛණය ලියන්න.

vii. අ. අයිතිකරුගේ හිමිකම අඩුවිමට බලපාන ගනුදෙනුවක් ලියන්න.

ආ. ව්‍යාපාරයේ 2021.01.31 දිනට වගකීම් කොපමණ ද?

viii. ව්‍යාපාරයේ 2021.01.31 දිනට ව්‍යාපාරය ලැබු ලාභය කොපමණද ?

ix. සුමින්දගේ අදහසට අනුව ඔහු විසින් ආරම්භ කළ යුතු නව ව්‍යාපාරය කුමක් ද?

x. අ එම ව්‍යාපාර සංවිධාන වර්ගය ලියාපදිංචි කළ යුතු පණත නම් කරන්න.

ආ. එම ව්‍යාපාර සංවිධානයේ ලක්ෂණ 2ක් ලියන්න. *(ලකුණු 02 ෆ 10 = 20 යි)*

## I **කොටස - ව්‍යාපාර අධ්‍යයනය**

(ප්‍රශ්ණ **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

02. i. අ. මූලික මිනිස් අවශ්‍යතා නම් කර ඊට අදාළ වුවමනා දෙක බැගින් ලියන්න.

ආ. ව්‍යාපාරිකයන් භාණ්ඩ වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමේ දී සලකා බලන කරුණු දෙකක් ලියන්න

ii. අවශ්‍යතා හා වුවමනා වල දැකිය හැකි වෙනස්කම් 4ක් ලියන්න.

iii. ව්‍යාපාරයක බාහිර පරිසර සාධක 4ක් ලියන්න.

iv. පහත සදහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. තාක්ෂණික වෙනස්වීම් ව්‍යාපාර කෙරෙහි බලපෑමක් නොකරයි. ( )

ආ. ආයෝජනයේ සුරක්ෂිතතාවය හා ව්‍යාපාරයේ අනාගත වර්ධනය ව්‍යාපාරයක කළමණාකරුවන්ගේ අරමුණු වේ. ( )

ඉ. රාජ්‍ය අංශයේ ව්‍යාපාර ද ලාභ අරමුණින් ආරම්භ කරන අවස්ථා ඇත. ( )

ඊ. රැකියා අවස්ථා උත්පාදනය රජය ව්‍යාපාර වලින් බලාපොරොත්තු වේ. ( )

*(ලකුණු 08 යි)*

03. i. අ. ආර්ථික පරිසර සාධක 4ක් නම් කරන්න.

ආ. රජය විසින් අණපනත් හා නීතිරීති පැනවීමේ අරමුණු 2ක් ලියන්න.

ii. පහත සදහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. රාජ්‍ය ප්‍රතිපත්ති පිළිබඳ සැලකිලිමත් වෙමින් ව්‍යාපාරිකයින් තම ව්‍යාපාර කටයුතු මෙහෙය විය යුතුය. ( )

ආ. තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ දියුණුවිම මුළු ලෝකයම විශ්ව ගම්මානයක් වීමට හේතු විය. ( )

ඉ. ව්‍යාපාරික අවස්ථා වලින් උපරිම ප්‍රයෝජන ගැනිමටත් තර්ජන සදහා සාර්ථකව මුහුණදීමටත් ව්‍යාපාරිකයා ක්‍රියා කළ යුතුය. ( )

ඊ. දේශීය ව්‍යාපාර වල පැවැත්ම අස්ථාවරවීම ගෝලීය පරිසරය නිසා සිදු වු හිතකර බලපෑමක් වේ. ( )

iii. අ. සමුපකාර සමිතියක ප්‍රජාතන්ත්‍රවාදි පාලනය පැවතිම යන්න හදුන්වන්න.

ආ. දෙපාර්තමේන්තුවක වාසි 2ක් ලියන්න.

iv. අ. ව්‍යාපාර කටයුතු සඳහා තාක්ෂණය භාවිත කරන අවස්ථා 2ක් ලියන්න.

ආ. ජංගම දුරකථන බැංකු ක්‍රමයේ වාසි 2ක් ලියන්න. *(ලකුණු 08 යි)*

04. i. අ. නිෂ්පාදනය කරනු ලබන නිෂ්පාදිත වල ස්වරුපය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කරන්න.

ආ. අරමුණ අනුව ව්‍යාපාර සංවිධාන වර්ගීකරණය කරන්න.

ii. අ. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපංදිචි කිරීමේ බලධරයා කවුද ?

ආ. ඒක පුද්ගල ව්‍යාපාරයක් ලියාපදිංචි කිරීමේ ක්‍රියාපටිපාටිය සඳහන් කරන්න.

iii. පරිමාණය අනුව ව්‍යාපාර සංවිධාන වර්ගීකරණයේ දී සලකනු ලබන ප්‍රමාණාත්මක නිර්ණායක 4ක් ලියන්න.

iv. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න.

අ. රජයෙන් ලබා දෙන දිරි ගැන්වීම් ලබා ගැනිමට ව්‍යාපාර ලියාපදිංචි කර තිබීම සුදුසුකමක් වේ. ( )

ආ. වාර්ෂික රාජ්‍ය අය-වැය ලේඛණය මගින් රාජ්‍ය සංස්ථා සඳහා අරමුදල් ප්‍රතිපාදනය කරයි. ( )

ඉ. පෞද්ගලික අංශයේ ඒකාධිකාරී බලය තුලින් ඇති කරන අහිතකර බලපෑම් වලට විසඳුමක් රාජ්‍ය සංස්ථා මගින් ලබා දේ. ( )

ඊ. සමුපකාර සමිති පෞද්ගලික අංශයේ සහයෝගය ලැබෙන රාජ්‍ය අංශයේ ව්‍යාපාර සංවිධානයකි. ( )

*(ලකුණු 08 යි)*

## II **කොටස - ගිණුම්කරණය**

(ප්‍රශ්ණ **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න.)

05. i. ගිණුම්කරණයේ ප්‍රධාන අරමුණ කුමක් ද?

ii. ලෙජරයේ දැකිය හැකි ප්‍රධාන ලෙජර් ගිණුම් මොනවාද ?

iii. පහත සඳහන් ගනුදෙනු ගිණුම් සමීකරණයට බලපාන ආකාරය දක්වන්න.

1. බැංකු ණයක් ගත්තා රු. 80,000
2. ප්‍රාග්ධනය යෙදුවා රු. 150,000
3. ගමන් වියදම් දැරුවා රු. 3,000
4. ණයහිමියන්ට ගෙව්වා රු. 20,000
5. ලී බඩු ණයට වික්කා රු. 80,000

iv. පහත සඳහන් ගනුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න.

1. අයිතිකරු රු.500,000ක තම මෝටර් රථය ව්‍යාපාරයට යෙදුවා
2. අත්පිට විකුණුම් රු. 100,000
3. ණයගැතියන්ගෙන් මුදල් ලැබුණා රු. 30,000
4. ණයට භාණ්ඩ ගත්තා රු. 35,000
5. අයිතිකරු පෞද්ගලික ප්‍රයෝජනයට ගත්තා රු. 25,000

*(ලකුණු 12 යි)*

06. i. උපයෝගී පොත් දෙකක් නම් කර ඊට අදාල මුලාශ්‍ර ලියවිල්ල බැගින් නම් කරන්න.

ii. පහත දැක්වෙන තොරතුරු වලින් චමිලාගේ ව්‍යාපාරයේ ගැණුම් ජ'නලය පිළියෙල කර ලෙජර් ගිණුම් පෙන්වන්න.

| | | | |
|---|---|---|---|
| 2021.12.05 | ඉන්වොයිස් අංක 43 | සාලින්දගෙන් ණයට ගැණුම් | රු. 5,000 |
| 2021.12.11 | ඉන්වොයිස් අංක 85 | ජයකොඩිගෙන් ණයට ගැණුම් | රු. 12,000 |
| 2021.12.19 | ඉන්වොයිස් අංක 25 | පරාක්‍රම ගෙන් ණයට ගැණුම් | රු. 9,000 |

iii. ෂෙහානිගේ ව්‍යාපාරයේ 2022 ජනවාරි මාස 31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 18,500ක් විය. නමුත් එදින ලද බැංකු ප්‍රකාශණයේ ශේෂය ඊට වෙනස් වුයෙන් එයට හේතු ලෙස පහත කරුණු අණාවරණය කර ගන්නා ලදි.

- ❖ තැන්පත් කළ නමුත් උපලබ්ධි නොවු චෙක්පත් රු. 8,500
- ❖ ස්ථාවර නියෝග මත බැංකුව ගෙවු ණය වාරිකය රු. 14,000
- ❖ නිකුත් කළ මුත් ගෙවීමට ඉදිරිපත් නොවු චෙක්පත් අංක 2018-රු. 1,500

  චෙක්පත් අංක 2020-රු. 7,000

- ❖ බැංකුව අය කළ චෙක්පොත් ගාස්තු රු. 1,500
- ❖ සෘජුවම බැංකුවට ලැබී ඇති ලාභාංශ රු. 10,000

**අවශ්‍ය වන්නේ,**

අ. 2022.01.31 දිනට සංශෝධන බැංකු ගිණුම

ආ. 2022.01.31 දිනට බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කරන්න. *(ලකුණු 12 යි)*

07. i. සුළු මුදල් අග්‍රිමය යන්න හඳුන්වන්න.

ii. සිනලි ගේ ව්‍යාපාරයේ පහත තොරතුරු ඔබට සපයා ඇත.

- ❖ සුළු මුදල් අග්‍රිමය රු. 2,500 කි.
- ❖ 2021 දෙසැම්බර් මාසයේ සුළු වියදම් වල එකතුව රු. 2,250 කි.
- ❖ 2022 ජනවාරි මාසය සඳහා සුළු මුදල් අග්‍රිමය ප්‍රතිපූරණය කරන ලදි.

2022 ජනවාරි මාසයේ සුළු මුදල් ගෙවීම් මෙසේ ය.

| | |
|---|---|
| 2022.01.02 | සංග්‍රහ වියදම් රු. 270 |
| 2022.01.04 | ගමන් ගාස්තු රු. 120 |
| 2022.01.07 | මුද්දර හා ලිපි කවර රු. 80 |
| 2022.01.10 | ලිපිද්‍රව්‍ය මිලට ගැනිම රු. 150 |
| 2022.01.11 | ගෙනඒමේ කුලි රු. 350 |
| 2022.01.13 | ත්‍රීවිලර් ගාස්තු රු. 200 |
| 2022.01.15 | සිසිල් බීම බෝතල් 2 ගත්තා රු. 180 |
| 2022.01.17 | ලිපි ලියාපදිංචි ගාස්තු රු. 70 |
| 2022.01.22 | කුමාර ට ගෙව්වා රු. 400 |
| 2022.01.23 | ගමන් වියදම් රු. 150 |
| 2022.01.26 | පරිත්‍යාග කළා රු. 100 |
| 2022.02.01 | අග්‍රිමය ප්‍රතිපූරණය කළා... |

සංග්‍රහ, ගමන්, තැපල්, විවිධ වියදම් සහ අනෙකුත් ලෙජර් ගිණුම් යන විශ්ලේෂණ තීරු යටතේ සුළු මුදල් පොත පිළියෙල කරන්න.

iii. පහත දැක්වෙන ශේෂයයන් ඇතුළත් කර නතාෂා ගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට ශේෂ පිරික්සුම පිළියෙළ කරන්න.

| | | | |
|---|---|---|---|
| මුදල් | රු. 14,000 | ණයහිමියෝ | රු. 8,000 |
| ලද වට්ටම් | රු. 1,000 | ණයගැතියෝ | රු. 12,000 |
| ලී බඩු | රු. 22,000 | බැංකු අයිරාව | රු. 5,000 |
| ගැණුම් | රු. 10,000 | විකුණුම් | රු. 15,000 |
| ප්‍රාග්ධනය | රු. 29,000 | | |

*(ලකුණු 12 යි)*